# වී ගොවිතැනේ වාග් ලක්ෂණ යටතට ගැනෙන කමත් භාෂාවේ භාවිත වචන වර්ගීකරණය (කළුතර දිස්ත්‍රික්කයේ ගල්පාත ගම්මානය ඇසුරින්)

සෙව්වන්දි කේ.ඩී.සී., කුමාරි අයි.ඒ.වී.පී.කේ. සහ කුමාරි බී.එස්.පී.

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යන අංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
kdcsewwandi1997@gmail.com

**සාරසංක්ෂේපය**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ගල්පාත නම් ගමෙහි ඈත කාලයේ සිටම වී ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය කරගත් ගැමි ජනයාටම ආවේණික වාග් විද්‍යාත්මක භාෂාවක් පවතී. ක්ෂේත්‍ර අධ්‍යනයේ දී ගල්පාත ප්‍රදේශ වාසීන් සමඟ සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි ඇසුරෙන් මෙම සාධක පිළිබඳව අධ්‍යයනය සිදු කළ අතර වාර්තාකරණ ක්‍රමවේදයක් තුළ ඡායාරූපගත කිරීම සිදු කරන ලදී. මෙම ගමෙහි ජීවත්වන පුද්ගලයිනගෙන් විසි දෙනෙකුගෙන් සමන්විත ස්තෘත සම්භාවී නියදියක් ඔස්සේ මෙම අධ්‍යයනය සිදු කරන ලදී. නියදිය තෝරා ගනු ලැබුවේ වයස් මට්ටම හා ඇතැම් ගැමියන් තුළ පැවති ශිල්ප ප්‍රාගුණ්‍ය හේතුවෙනි. ඒ අනුව ගල්පාත ගම්මානයේ වී ගොවිතැනේ යෙදෙන පුද්ගලයින් කණ්ඩායමක් තෝරාගෙන ඔවුන්ව මෙහි දත්ත දායකයින් ලෙස සම්බන්ධ කර ගැනීම සිදු විය. මෙම ගම්මානය ආශ්‍රිතව ඇති වී ගොවිතැනේ වාග් ලක්ෂණ යටතට ගැනෙන කමත් භාෂාව පිළිබඳව ගම්වැසියන්ගෙන් අසා දැනගත් කමත් භාෂාවේ භාවිත විවිධ වචන වර්ගීකරණයක් යටතේ බෙදා දැක්වීම මඟින් සමාජයට යම් දැනුමක් ලබා දීම මෙම අධ්‍යනයෙහි මූඛ්‍ය අරමුණයි. මෙම අධ්‍යනය කිරීමට හේතුව වන්නේ කමත් භාෂාවේ විශේෂ ලක්ෂණ සහිත දෙසියයකට ආසන්න වචන ප්‍රමාණයක් හඳුනා ගැනීමට ලැබීම හා කමත් භාෂාව ගොවිතැනත් සමඟම අභාවයට යාම යන හේතු සාධක මතයි. මේ පිළිබඳව ප්‍රථමයෙන් ම මූලික අධ්‍යනයක් සිදු කරනු ලැබූ අතර එහි දී මෙම ගැමියන්ගේ භාෂාවේ ඇති විශේෂ ලක්ෂණ පෙනී ගිය අතර එසේම කමත් භාෂාවේ වචනවල එකිනෙකට වෙනස්කමක් දක්නට ලැබීම හේතුවෙන් ඒහා බැඳි තතු විවිධ ප්‍රවේශයන් ඔස්සේ ගොනු කිරීමට හැකි විය. ක්ෂේත්‍රයට යාමෙන් වී ගොවිතැනේ වාග් විද්‍යාව හා සම්බන්ධ කමත් භාෂාවේ සත්ව නාම, පුද්ගල නාම, ස්ථාන නාම, ද්‍රව්‍ය නාම, සමූහ නාම, ගුණ නාම, ජාති නාම (ප්‍රාණවාචී), ජාති නාම (අප්‍රාණවාචී), අප්‍රාණවාචී නාම පද, ගොයම් වලට කියන පද, ක්‍රියා පද හා සංඛ්‍යා මෙන්ම ප්‍රමාණයන්. හැඟවෙන වචන යනාදී විවිධාකාර වූ නාම පදයන් හා ක්‍රියා පදයන් මෙන් ම ඒවායේ අරුත් (පොදු වහර) පිළිබඳව තොරතුරු රැසක් හමු වූ අතර එම දත්තයන් එලෙස වර්ගීකරණයක් යටතේ පෙන්වා දිය හැකි වේ. කෙසේ වුවද වර්තමානය වන විට සම්ප්‍රදායික කමත් බස සමාජයෙන් දුරස්ව අභාවයට යාමට ප්‍රධානතම හේතුව වී ඇත්තේ මෙම කර්මාන්තයේ නියැලෙන පිරිස් වල හිඟතාවය යැයි සිතිය හැකිය. එයට හේතුව නව පරපුර පිපාසයෙන් මෙන් දැනුම සොයා යාමයි. එම නිසා කුඹුරට බැසීමට දරු කැළ අකමැත්තක් මෙන්ම එම රැකියාව මදි පුංචිකමක් ලෙසට සැළකීම බැව් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** *වී ගොවිතැන, වාග් ලක්ෂණ, කමත් භාෂාව*